WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) ලී කැටයමින් කළ නළඟනකගේ රූපය දැකිය හැක්කේ ................................... දේවාලයේ දී ය.

(ii) රාජ ආඥාවක් සන්නිවේදනය කිරීමට අතීතයේ දී ................................. වාදනය කරන ලදී.

(iii) වේශ නිරූපණය අයත් වන්නේ සතර අභිනයෙන් ............................ අභිනයට ය.

(iv) මිනිස් චරිත හා අතිමානුෂ චරිත යොදා ගනු ලබන්නේ ................................ නාටකයේ දී ය.

(v) xiv වන ලුවී රජ ................................ රංග කලාවේ පුරෝගාමියා ලෙස සැලකේ.

(vi) කරදිය මුද්‍රා නාට්‍යයේ සිසීගේ චරිතයට රංගන දායකත්වය ලබා දුන්නේ........................................ නර්තන ශිල්පිණියයි.

(vii) බණ්ඩාර දෙවි සත් කට්ටුව හා වැදි යකුන් පුද ලබන්නේ .................................. ශාන්තිකර්මයේ දී ය.

(viii) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයේ වන්නම්, ප්‍රශස්ති, හටන් කවි ගායනා කරන ලද්දේ ...................... මඩුවේ දී ය.

(xi) පහත සඳහන් නර්තනාංග අයත් භාරතීය නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.
(අ) අලාරිප්පු ...........................................
(ආ) පරන් ...........................................

(x) සිරිබෝහාමි, නිත්තවෙල ගුණයා යන ශිල්පීන් වඩාත් ප්‍රසිද්ධියට පත් වූ නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.
(අ) සිරිබෝහාමි ...........................................
(ආ) නිත්තවෙල ගුණයා ...........................................

**2.** (i) මාත්‍රා තුනේ (123 / 123) තනිතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.

(ii) මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් වන්නමක/සින්දු වන්නමක කවි පදයක් ප්‍රස්තාරගත කරන්න.

(iii) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් කස්තිරමක්/ඉරට්ටියක්/කලාසමක් ප්‍රස්තාරගත කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) මණ්ඩිය (ii) ග්‍රහපංති
(iii) උඩැක්කිය (iv) දේශීය අවනද්ධ භාණ්ඩ
(v) වන්නම්

**4.** දේශීය ශාන්තිකර්ම ගත් කල පොදු ව්‍යුහයන් හා අන්තර්ගත සිද්ධීන් හි සහසම්බන්ධතාවක් ඇති බව පිළිගත හැකි ය.

(i) පහන් මඩුවේ හා දෙවොල් මඩුවේ එන නාට්‍යමය අවස්ථා **දෙක** බැගින් වෙන් කොට ලියන්න.

(ii) යක් ඇනුම නර්තනය හෝ දෙවොල් නර්තනය හෝ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(iii) කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්මවල එන පුරාවෘත්තවලින් කියැවෙන සිද්ධිවල සමාන අසමානතා විමසුමට ලක් කරන්න.

[අවවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

5. ජන නැටුම් හා ජන නාටක ජීවිතය විදහා දක්වන කලාංග වේ.

   (i) මෝල්ගස් හෝ කඩු හෝ රබන් හෝ කවියක් ලියන්න.

   (ii) සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

   (iii) ජස ලෙන්චිනා කෝලම ඇසුරෙන් ජන ජීවිතය විවරණය වන ආකාරය විමසුමට ලක් කරන්න.

6. පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

   (i) **A** රූපයෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදාය සහ රංගවස්ත්‍රාභරණ **දෙකක්** නම් කරන්න.
   (ii) **B** රූපයෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදාය සහ වේශනිරූපණ ක්‍රම **දෙකක්** ලියා දක්වන්න.
   (iii) **C** රූපයෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩ **දෙකක්** හඳුන්වන්න.

7. රූපවාහිනිය, නර්තන කලාවේ උන්නතියට මෙන් ම පරිහානියට ද හේතු වී ඇත.

   (i) රූපවාහිනිය මගින් විකාශනය වන නර්තන වැඩ සටහන් **හතරක්** නම් කරන්න.

   (ii) රූපවාහිනී නර්තන නිර්මාණයන්හි රංග වස්ත්‍රාභරණවල දේශීය අනන්‍යතා ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

   (iii) දේශීය නර්තන කලාවේ දියුණුව සඳහා රූපවාහිනිය යොදාගත හැකි ආකාරය පිළිබඳ ව ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....